" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 SLSI SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/30-38/FI/01 | |
| ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | |
| දිනය / திகதி / Date | 2025.01.24 | |

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනිම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19-2025 හා 2025.01.23 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/2024 හා 2024.12.30 | “ක්ලීන් ශ්‍රී ලංකා” ජාතික වැඩසටහන සමඟ 2025 වසරේ රාජකාරි කටයුතු ඇරඹීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2024 හා 2024.12.24 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2025 වසර |
| 03. | රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 07/2020 (1) හා 2024.10.30 | පූර්ව තනතුර සඳහා ඉදිරිපත් කර ඇති වෛද්‍ය පරීක්ෂණ වාර්තාව රජයේ සේවයේ වෙනත් තනතුරක් සඳහා අදාල කර ගැනීම |
| 04. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2011 (1) හා 2024.11.29 | ජාතික කොඩිය නිවැරදි භාවිතය |
| 05. | පොදු චක්‍රලේඛ ලිපි අංක 02-55/2023 හා 2023.03.21 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය මගින් පවත්වනු ලබන ආංශික ප්‍රවේශ බී.එස්.සී (ගෞරව) හෙද, ඖෂධවේදී (ගෞරව), බී.එස්.සී (ගෞරව), වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ හා බී.එස්.සී (ගෞරව), අක්ෂිතාක්ෂණවේදී යන උපාධි පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් බඳවා ගැනීම - 2023 |

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 06. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2024 හා 2024.11.12 | රාජ්‍ය අංශයේ පරිගණක කටයුතු සඳහා යුනිකේත හා අනුකූල අක්ෂර භාවිතා කිරීම |
| 07. | ජනාධිපති කාර්යාල චක්‍රලේඛ PS/SB/Circular/1/2025 හා 2025.01.01 | විදෙස් රාජ්‍ය, ජාත්‍යන්තර සංවිධාන, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ රජයේ අමාත්‍යාංශ / ආයතන පවත්වනු ලබන අන්තර්ක්‍රියා |
| 08. | ස්වදේශ කටයුතු චක්‍රලේඛ 01/2025 හා 2025.01.10 | 77 වන නිදහස් දින සමරු උළෙල - 2025 |

02. මෙම චක්‍රලේඛ පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

එස්.එම්.එච්. කුසුම්සිරි,
පරිපාලන නිලධාරි
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092607
ෆැක්ස් අංකය : 011-2092609
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය
மேல் மாகாண ஆளுநர் பணிமனை
GOVERNOR'S OFFICE - WESTERN PROVINCE

අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
இல. 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
No. 204, Denzil Kobbekaduwe Mawatha Battaramulla.


ඔබේ අංකය / உமது இல / Your Ref: CSWP/ADM/30-38/FI/01
මගේ අංකය / எனது இல / My Ref: GOS/ADM/6/2/19-2025
දිනය / திகதி / Date: 2025.01.23

"ජනතා හිතවාදී විශිෂ්ටතම පළාත් රාජ්‍ය සේවාවක්" -" பொது மக்களுக்கு சிறந்த பொதுச் சேவை " -" People Friendly Excellent Public Service "

ප්‍රධාන ලේකම් කාර්යාලය / පාලන අංශය / 23 JAN 2025 / බස්නාහිර පළාත් සභාව

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය
බස්නාහිර පළාත.

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ ( මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත මැයෙන් යුතුව මා අමතන ලද ඔබේ සමාංක හා 2025.01.20 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව පහත සඳහන් චක්‍රලේඛයන් පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වමි.

| චක්‍රලේඛ අංකය | චක්‍රලේඛ නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/2024 | 2024.12.30 | "ක්ලීන් ශ්‍රී ලංකා" ජාතික වැඩසටහන සමඟ 2025 වසරේ රාජකාරී කටයුතු ඇරඹීම |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2024 | 2024.12.24 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2025 වසර |
| රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 07/2020(1) | 2024.10.30 | පූර්ව තනතුර සඳහා ඉදිරිපත් කර ඇති වෛද්‍ය පරීක්ෂණ වාර්තාව රජයේ සේවයේ වෙනත් තනතුරක් සඳහා අදාල කර ගැනීම |
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2011(1) | 2024.11.29 | ජාතික කොඩිය නිවැරදි භාවිතය |
| පොදු චක්‍රලේඛ 02-55/2023 | 2023.03.21 | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය මගින් පවත්වනු ලබන ආංශික ප්‍රවේශ බී.එස්.සී (ගෞරව) හෙද, ඖෂධවේදී (ගෞරව), බී.එස්.සී (ගෞරව) වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ හා බී.එස්.සී (ගෞරව) අක්ෂිතාක්ෂණවේදී යන උපාධි පාඨමාලි හැදෑරීම සඳහා නිලධාරීන් බඳවා ගැනීම -2023 |


| ආණ්ඩුකාර ලේකම් / ஆளுநரின் செயலாளர் / Secretary to the Governor | සහකාර ලේකම් I / உதவிச் செயலாளர் I / Assistant Secretary I | සහකාර ලේකම් II / உதவிச் செயலாளர் II / Assistant Secretary II | නීති නිලධාරී / சட்ட அதிகாரி / Legal Officer | පරිපාලන නිලධාරී / நிர்வாக அதிகாரி / Administrative Officer | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel : 011-2092816<br>Fax : 011-2092813<br>e-mail: secretary@secgov.wp.gov.lk | e-mail: ass.secretary1@secgov.wp.gov.lk | e-mail: ass.secretary2@secgov.wp.gov.lk | Tel : 011-2092819<br>e-mail: legalofficer@secgov.wp.gov.lk | e-mail: ao@secgov.wp.gov.lk | Tel : 011-2093670<br>Fax : 011-2092771<br>e-mail: governoroffice@secgov.wp.gov.lk |

| | | |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/2024 | 2024.11.12 | රාජ්‍ය අංශයේ පරිගණක කටයුතුසඳහා යුනිකේත හා අනුකූල අක්ෂර භාවිත කිරීම |
| ජනාධිපති කාර්යාල චක්‍රලේඛ PS/SB/Circular/1 / 2025 | 2025.01.01 | විදේශ රාජ්‍ය, ජාත්‍යන්තර සංවිධාන, ශ්‍රී ලංකාවේ පිහිටි විදේශීය දූත මණ්ඩල සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ රජයේ අමාත්‍යාංශ/ ආයතන පවත්වනු ලබන අන්තර්ක්‍රියා |
| ස්වදේශ කටයුතු චක්‍රලේඛ 01/2025 | 2025.01.10 | 77 වන නිදහස් දින සමරු උළෙල - 2025 |


කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාත

දුරකතන අංක - 0112-092816
ෆැක්ස් - 0112-092813
විද්‍යුත් තැපැල - governoroffice@secgov.wp.gov.lk

දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

මගේ අංකය )
எனது இல )
My No ) ETR/B Sc Degree-Japura 02 2022

ඔබේ අංකය )
உமது இல )
Your No )

දිනය )
திகதி )
Date ) 21 . 03.2023

03 OCT 2024
බස්නාහිර පළාත

# සුවසිරිපාය
# சுவசிரிபாய
# SUWASIRIPAYA
# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය
27 SEP 2024
104/144
බස්නාහිර පළාත

පොදු චක්‍රලේඛ ලිපි අංක: 02- 55 / 2023

018915

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
ප්‍රාදේශීය සේවා අධ්‍යක්ෂවරුන්
විශේෂඥ අංශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානීන්
ජාතික අමාත්‍යාංශ යටතේ පාලනය වන රෝහල් අධ්‍යක්ෂවරුන් හා ආයතන ප්‍රධානීන්

<u>ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය මගින් පවත්වනු ලබන ආංශික ප්‍රවේශ බී.එස්.සී (ගෞරව) හෙද, ඖෂධවේදී (ගෞරව),බී.එස්.සී (ගෞරව) වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ හා බී.එස්.සී. (ගෞරව) අක්ෂිතාක්ෂණවේදී යන උපාධිපාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් බඳවා ගැනීම 2023</u>

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය මගින් පවත්වනු ලබන බී.එස්.සී (ගෞරව) හෙද, ඖෂධවේදී (ගෞරව),බී.එස්.සී (ගෞරව) වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යා සහ බී.එස්.සී (ගෞරව) අක්ෂිතාක්ෂණවේදී යන ආංශික ප්‍රවේශ උපාධි පාඨමාලා හැදෑරීම සඳහා ජාතික සෞඛ්‍ය අමාත්‍යාංශය / පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ යටතේ සේවයේ නියුතු හෙද , ඖෂධවේදී වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ නිලධාරීන් සහ අක්ෂිතාක්ෂණවේදී යන නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. බී.එස්. සී.(ගෞරව) සිව් අවුරුදු (04) උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගත් අපේක්ෂකයින් පළමු වසරින් නිදහස් කර 2023 අප්‍රේල් මස ආරම්භ වන දෙවන අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කරගනු ලැබේ.

<u>ඇතුළත්වීමේ සුදුසුකම්</u>

I. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ අවම වශයෙන් වසර03 ක සේවා කාලයක් සපුරා තිබීම.
II. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට වයස අවුරුදු 45 ට අඩුවීම
III. අ.පො.ස.(උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව. (සත්ත්ව විද්‍යාව හා උද්භිද විද්‍යාව) රසායන විද්‍යාව. හා භෞතික විද්‍යාව එකවරකදී සමත්ව තිබීම.
IV. අ.පො.ස.(සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් සාමාර්ථයක් (S) ලබාගෙන තිබීම.
V. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පවත්වනු ලබන ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කරන ලද ඩිප්ලෝමාධාරියෙකු වීම
VI. ශ්‍රීලංකා වෛද්‍ය සභාවෙහි / ශ්‍රී ලංකා හෙද සභාවෙහි ලියාපදිංචි වී තිබීම අනිවාර්යය වේ.
VII. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන විට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් ( NVQ level ) මට්ටම සපුරා තිබිය යුතුය.
VIII. තෝරාගත් පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම
IX. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මගින පවත්වනු ලබන ලිඛිත හා වාචික පරීක්ෂණයක් මත පදනම්ව තෝරා ගැනීම සිදුවේ

2. අයදුම්පත්‍ර

1 මේ සමග අමුණා ඇති ආකෘති පත්‍රයට අනුව සකස් කරන ලද අයදුම්පත් සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ආයතනයක් නම් ආයතන ප්‍රධානියා විසින්ද, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නම් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ද නිසි පරිදි සහතික කර ආයතන ප්‍රධානියා / පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ මගින් 2023 අප්‍රේල් 17 වන දින හෝ ඊට පෙර **නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ), සුවසිරිපාය, නො. 385 , පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10** වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අසම්පූර්ණ හෝ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ "**ශ්‍රී ජයවර්ධන විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය මගින් පවත්වනු ලබන බී.එස්.සී (ගෞරව) හෙද, ඖෂධවේදී (ගෞරව),බී.එස්.සී (ගෞරව).වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ සහ බී.එස්.සී..(ගෞරව) අක්ෂිතාක්ෂණවේදී (ගෞරව)උපාධි පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් බඳවා ගැනීම. 2023** යනුවෙන් සඳහන් කළ යුතුය" ( ඔබගේ උපාධිපාඨමාලාව වර්ණ ගන්වන්න)

3. තෝරා ගැනීමේ පරීක්ෂණය

අයදුම්කරුවන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය මගින් පවත්වනු ලබන සිද්ධාන්ත හා ප්‍රායෝගික පරීක්ෂණමය කොටස්වලින් සමන්විත තෝරා ගැනීමේ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය.

4. සැලකිය යුතුයි

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් එක් එක් පාඨමාලාවට සාපේක්ෂව බඳවා ගන්නා සිසුන් ප්‍රමාණයෙන් 30 % ප්‍රමාණයක් පමණක් ආංශික ප්‍රවේශ උපාධි පාඨමාලා සඳහා බඳවා ගනු ලැබේ.

II. ජාතික වෘත්තීය සුදුසුකම්( NVQ level ) මට්ටම පහ (5) නම් ලකුණු 30 ක් ද ජාතික වෘත්තීය සුදුසුකම්( NVQ level ) මට්ටම හය (6) නම් ලකුණු 60 ක් ද හිමි වේ.( NVQ level ) මට්ටම පහ (5) SLQF level (3) ට ද සමාන වන අතර ( NVQ level ) මට්ටම හය (6) SLQF level මට්ටම (4) ට සමාන වේ.

III. සම සෞඛ්‍ය අධ්‍යයනයට සම්බන්ධ වන අයදුම්කරුවන් ඇතුළත් කිරීමේදී SLQF වර්ගීකරණයට අනුව වසර දෙකක (2) ඩිප්ලෝමාවක් ඩිප්ලෝමාවක් ලෙසත් වසර තුනක (3) ඩිප්ලෝමාවක් SLQF වර්ගීකරණයට අනුව උසස් ඩිප්ලෝමාවක් ලෙසත් සලකනු ලැබේ.

5.සේවා ගිවිසුම

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යා පීඨය මගින් පවත්වනු ලබන බී.එස්.සී (ගෞරව) හෙද, ඖෂධවේදී (ගෞරව), බී.එස්.සී (ගෞරව).වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ හා බී.එස්.සී.(ගෞරව) අක්ෂිතාක්ෂණවේදී යන උපාධි පාඨමාලා හැදෑරීම සඳහා තෝරා ගත් අපේක්ෂකයින්ට අවුරුදු තුනක් සඳහා වැටුප් සහිත නිවාඩු ප්‍රදානය කෙරෙන අතර නිසි පරිදි පාඨමාලාව නිමා කරන බවට හා උපාධි පාඨමාලාව හැදෑරීමෙන් පසුව අවුරුදු දහයක කාල සීමාවක් සෞඛ්‍ය අමාත්‍යාංශය/ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය සඳහා සේවය කරන බවට ඔවුන් රුපියල් 600,000.00 ක මුදලක් සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සමග බැඳුම්කරයක් අත්සන් කළ යුතුය.

තෝරාගත් අපේක්ෂකයෙකු එකී උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමට හෝ බැඳුම්කරයකට හා ගිවිසුමට අදාලව සෞඛ්‍ය අමාත්‍යාංශය /පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය පනවන ලද කොන්දේසි සපුරාලීමට අපොහොසත් වන්නේ නම් එවැනි අපේක්ෂකයෙකුට එරෙහිව සුදුසු පරිදි නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

කෙසේ වුවද, මෙම පුහුණුව හේතු කොටගෙන ඉහළ තනතුරක් ඉල්ලා සිටීමට අපේක්ෂකයින්ට අයිතියක් නොමැත. එසේනම් පාඨමාලාව නිමා කළ අභ්‍යාසලාභීන් ඉහළ තනතුරක් සඳහා දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කිරීම පවතින පුරප්පාඩු සංඛ්‍යාව මත හා හුදෙක්ම පත්කිරීමේ බලධාරීන්ගේ අභිමතය පරිදි සිදුවන්නේය.

6. මෙම චක්‍රලේඛයේ අන්තර්ගත කරුණු කෙරෙහි ඔබ ආයතනයේ/ පළාත් /ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ බල ප්‍රදේශයේ/ විශේෂිත ව්‍යාපාරයේ සේවයේ නියුතු හෙද , ඖෂධවේදී හා වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ හා අක්ෂිතාක්ෂණවේදී නිලධාරීන්ගේ අවධානය යොමු කරවීමට වග බලා ගන්නා මෙන් කාරුණිකව ඉල්ලමි.

7. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම චක්‍රලේඛයේ භාෂා අතර කිසියම් අනනුකූලතාවයක් පවතිනම් එවැනි විටෙක සිංහල භාෂා චක්‍රලේඛය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත
ලේකම්

සෞඛ්‍ය අමාත්‍යාංශය

385, පූජ්‍ය ... මාවත,

**එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත**
**ලේකම්.**

පිටපත්

1. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - දැ.ගැ.පි.
2. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II / නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) III .ගිවිසුම් සහ ඇපකර සැකසීමට
3. අධ්‍යක්ෂ (පාලන) I/ අධ්‍යක්ෂ (පාලන) II -අ.ක.ස.
4. ප්‍රධාන නීති නිලධාරී - සෞඛ්‍ය අමාත්‍යාංශය අ.ක.ස.
5. පීඨාධිපති. සමසෞඛ්‍ය විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය - දැ.ගැ.පි.
6. පාඨමාලා සමායෝජක. (බී.එස්.සී හෙද, ඖෂධවේදී , බී.එස්.සී වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ සහ බී.එස්.සී. අක්ෂිතාක්ෂණවේදී) සමසෞඛ්‍ය විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය

කාර්යාලයීය ප්‍රයෝජනය
සඳහා පමණි

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සම සෞඛ්‍ය විද්‍යාපීඨය මගින් පවත්වනු ලබන බී.එස්.සී (ගෞරව) භෙද, ඖෂධවේදී (ගෞරව),බී.එස්.සී (ගෞරව) වෛද්‍ය රසායනාගාර, කාර්මික විද්‍යාඥ හා බීඑස්.සී.(ගෞරව) අක්ෂිතාක්ෂණවේදී යන උපාධි පාඨමාලා හැදෑරීම සඳහා නිලධාරීන් බඳවා ගැනීම- 2023 සඳහා අයදුම්පත්‍රය

1. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

..........................................................................................................................................................

..........................................................................................................................................................

2. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

..........................................................................................................................................................

..........................................................................................................................................................

3. පත්වීම්බලධාරියා (තනතුර)..........................................................................................................

4. පළමු පත්වීමේ දිනය .................................. වර්තමාන ශ්‍රේණිය...................................................

5. ලිපිනය I. රාජකාරි..........................................................................................................................

II. පෞද්ගලික.........................................................................................................................

III. දුරකථන-අංකය : රාජකාරි........................පෞද්ගලික..................ජංගම.......................................

6. පෞද්ගලික තොරතුරු

උපන් දිනය............................................. ජා.හැ. අංකය...................................

7. වයස අවු ............. මාස ............... දින ............... (2023 අප්‍රේල් 17 වන දිනට)

8. ස්ත්‍රී /පුරුෂ භාවය ......................... විවාහක /අවිවාහක ................................

9. අධ්‍යාපන සුදුසුකම්

අ.පො.ස (උ/පෙළ) විභාග ප්‍රතිඵල විභාග අංකය ........... වර්ෂය........

| විෂය | සාමාර්ථය |
| --- | --- |
| ..................... ........... | .............. |
| ..................... ........... | .............. |
| ....... ... ................ ....... | .............. |

අ.පො.ස (සා/පෙළ) විභාග ප්‍රතිඵල විභාග අංකය .......... වර්ෂය......

| විෂය | සාමාර්ථය |
| --- | --- |
| ඉංග්‍රීසි | ......................... |

10. රැකියාව පිළිබඳ විස්තර

I. වර්තමාන තනතුර පිළිබඳ විස්තර

තනතුර- ........................................

ආයතනය/ දෙපාර්තමේන්තුව- ........................................

වර්තමාන ආයතනයට පත් වූ දිනය- ........................................

ස්ථිර/විශ්‍රාම වැටුප් සහිත / විශ්‍රාම වැටුප් රහිත/තාවකාලික යන වග

සේවයේ ස්ථිර වී ඇති බව - ........................................ස්ථිර නම් එම දිනය

II. පෙර දරන තනතුර පිළිබඳ විස්තර

| ආයතනය | තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

III. වෘත්තිය සුදුසුකම්/වෙනත් සුදුසුකම්

| විභාගය | වර්ෂය | ආයතනය | සාමාර්ථය/ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

11. ඔබ කවරදාක හෝ අපරාධ වරදක් සඳහා උසාවියකින් වැරදිකරු වී තිබේද? ........................................

ඒසේ නම් එකී වරද පිළිබඳ සහ පනවන ලද දඬුවම පිළිබඳ විස්තර සපයන්න

........................................................................................................

12. හෙද / ඖෂධවේදී / වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ හා අක්ෂිනාක්ෂණවේදී නිලධාරියෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ / ශ්‍රී ලංකා හෙද සභාවේ ලියාපදිංචිය

ලියාපදිංචි අංකය........................................දිනය........................................

13. අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි සඳහන් යම්කිසි තොරතුරක් අසම්පූර්ණ බැව් හෝ වැරදි බැව් අනාවරණය වුවහොත් මගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලබන බවත් පසුව එසේ අනාවරණය වුවහොත් මගේ ශිෂ්‍යභාවය අවසන් කරනු ලබන බවත් බැඳුම්කරයට හා ගිවිසුමට අනුව අදාළ කවර හෝ ගාස්තු සහ අනෙකුත් වියදම් අයකර ගනු ලැබීමට ද යටත්වන බවත් මම දනිමි.

මෙම පුහුණුව හේතුකොට ගෙන ඉහළ තනතුරක් ඉල්ලා සිටීමට මා හට අයිතියක් නොමැති බවද, මා මෙම පාඨමාලාව සම්පූර්ණ කළද දෙපාර්තමේන්තුවෙන් අතිරේක ප්‍රතිලාභ ඉල්ලුම් කිරීමට අයිතියක් නොමැති බවද දනිමි.

ඉහත පාඨමාලාවට මා තෝරා ගනු ලැබුවහොත් දැන්වීමෙහි සඳහන් කර ඇති පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්/පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට අත්සන් කළ යුතු බවද දනිමි.

........................................ ........................................

දිනය අයදුම්කරුගේ අත්සන

ආයතන ප්‍රධානියාගේ සහතිකය

.......................................... (තනතුර) මයා/මිය/මෙය විසින් මෙම අයදුම්පතේ අංක 1 සිට 12 දක්වා සපයා ඇති තොරතුරු නිවැරදි බවත් ඔහුගේ/ඇයගේ/ රාජකාරි කටයුතු සහ හැසිරීම .............................. බවත් සහතික කරමි. ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් වසර 03ක සමසෞඛ්‍ය විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ බී.එස්.සී (ගෞරව) හෙද, ඖෂධවේදී (ගෞරව),බී.එස්.සී (ගෞරව).වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ හා බී.එස්.සී.(ගෞරව) අක්ෂිතාක්ෂණවේදී යන ආංශික ප්‍රවේශ උපාධි පාඨමාලා හැදෑරීම සඳහා මුදා හැරිය හැකි බවද දන්වා සිටිමි.

..........................................
දිනය

..........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
(රබර් මුද්‍රාව)

*******************************************************************************************

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ සහතිකය (පළාත් අයදුම්කරුවන් සඳහා)

.......................................... (තනතුර) මයා/මිය/මෙය විසින් මෙම අයදුම්පතේ අංක 1 සිට 12 දක්වා සපයා ඇති තොරතුරු නිවැරදි බවත් ඔහුගේ/ඇයගේ/ රාජකාරි කටයුතු සහ හැසිරීම .............................. බවත් සහතික කරමි. ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් වසර 03 ක සමසෞඛ්‍ය විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ බී.එස්.සී (ගෞරව) හෙද, ඖෂධවේදී (ගෞරව),බී.එස්.සී (ගෞරව).වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ හා බීඑස්.සී (ගෞරව) අක්ෂිතාක්ෂණවේදී යන ආංශික ප්‍රවේශ උපාධි පාඨමාලා හැදෑරීම සඳහා මුදා හැරිය හැකි බවද දන්වා සිටිමි.

..........................................
දිනය

..........................................
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අත්සන
(රබර් මුද්‍රාව)

*******************************************************************************************

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ සහතිකය (පළාත් අයදුම්කරුවන් සඳහා)

.......................................... (තනතුර) මයා/මිය/මෙය විසින් මෙම අයදුම්පතේ අංක 1 සිට 12 දක්වාසපයා ඇති තොරතුරු නිවැරදි බවත් ඔහුගේ/ඇයගේ/ රාජකාරි කටයුතු සහ හැසිරීම .............................. බවත් සහතික කරමි. ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් වසර 03 ක සමසෞඛ්‍ය විද්‍යා පීඨය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ බී.එස්.සී (ගෞරව) හෙද, ඖෂධවේදී (ගෞරව),බී.එස්.සී (ගෞරව).වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ හා බීඑස්.සී (ගෞරව) අක්ෂිතාක්ෂණවේදී යන ආංශික ප්‍රවේශ උපාධි පාඨමාලා හැදෑරීම සඳහා මුදා හැරිය හැකි බවද දන්වා සිටිමි.

..........................................
දිනය

..........................................
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අත්සන
(රබර් මුද්‍රාව)